-----------------------------------------------------------------------------------------------------------------

කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

----------------------------------

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 14 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 සැප්තැම්බර් 18 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 <u>මතය</u>

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 උනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළබඳ අදහස් දැක්වීම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). වර්ෂයට අදාලව ලද උසාවි දඩ ආදායම රු.18,615,579 ක් වුවද, එය මූල්‍ය ප්‍රකාශන වලට රු.16,997,572 ක් ලෙස ගෙන තිබීම හේතුවෙන් උසාවි දඩ ආදායම රු.1,618,007 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ආ). ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ ආදායම රු.3,606,478 ක් මූල්‍ය ප්‍රකාශන වලට නොගැනීම හේතුවෙන් වැටුප් ප්‍රතිපූර්ණ ආදායම සහ ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ ශේෂය රු.3,606,478 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඇ). මූල්‍ය ප්‍රකාශන අනුව පුස්තකාල පොත් වටිනාකම රු.6,768,285 ක් වුවද, පුස්තකාල පොත් සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව එම වටිනාකම රු.6,175,089 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය අවසානයට පුස්තකාල පොත් ශේෂය රු.593,196 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඈ). මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු එකතු කළ අගය මත බදු මුදල රු.314,946 ක් වුවද, ලේඛණ අනුව ගෙවිය යුතු වැට් බදු මුදලක් නොවූයෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු බදු රු.314,946 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි.

1.3.2 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.169,819,581 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,816,680 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.23,915,625 ක් විය.

2.2 <u>ආදායම් පරිපාලනය</u>

2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්</u>

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) | වරිපනම් හා බදු | 276 | 252 | 402 |
| (ii) | බදුකුලී | 4,758 | 4,793 | 39 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,032 | 1,068 | 43 |
| (iv) | වෙනත් ආදායම් | 48,553 | 75,708 | 27,502 |

2.2.2 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යතු උසාවි දඩ ප්‍රමාණය රු…5,588,375 ක් හා ලැබිය යුතු මුද්දර ගාසතු ප්‍රමාණය රු…21,274,633 ක් විය.

2.3 <u>අවිධිමත් ගනුදෙනු</u>

සභාව විසන් 2011 අප්‍රේල් 04 දින ශ්‍රී ලංකා රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාවෙන් රු.82,310 ක් වැයකර ඇඟිලි සළකුණු යන්ත්‍රයක් මිලදීගෙන තිබූ අතර විධිමත් ටෙන්ඩර් පරිපාටියක් යටතේ පුවත්පත් දැන්වීමක් පලකර මිල ගණන් කැඳවා අවම මිල ගණන් යටතේ මිලදී ගැනීම සිදුකර

නොතිබුණි. යන්ත්‍රය 2011 ජුනි 30 දින සිට අක්‍රීය වී තිබූ අතර ඇහිලි සළකුණු යන්ත්‍රය මිලදීගත් ආයතනය විසින් වර්ෂයක වගකීම් කාලයක්ද ලබාදී තිබියදී එය අළුත්වැඩියා කරගැනීමට සභාව විසින් අදාල ආයතනය වෙත ඉල්ලීමක් කර නොතිබුණි.

2.4 <u>වත්කම් කළමනාකරණය</u>

භෞතික පරීක්ෂණ / සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු නොවූ 2012 දෙසැම්බර් 31 දිනට පොත් අගය මත ගණන් බැලූ ඉඩම් හා ගොඩනැගිලි, මෝටර් රථ සහ යන්ත්‍රෝපකරණ වටිනාකම රු.88,619,214 ක් වූ අතර ලීබඩු හා සවිකිරීම් සහ තොගය සමීක්ෂණය කර පැවතියද ඒවා අගය කර දක්වා නොතිබුණි. මූලාා ප්‍රකාශන අනුව එම වත්කම් වල වටිනාකම රු.4,677,476 ක් විය.

2.5 <u>මානව සම්පත් කළමනාකරණය</u>

සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 94 ක් වූ අතර, සත්‍ය සේවක සංඛ්‍යාව 84 ක් වූයෙන් පුරප්පාඩු සංඛ්‍යාව 10 ක් විය. ඊට ඇතුළත් අනුමත කාර්මික නිලධාරි තනතුරු 04 න් 03 ක්ද ආදායම් පරිපාලක තනතුරු 04 න් 01 ක්ද පුස්තකාලයාධිපති තනතුරු 09 න් 06 ක්ද පුරප්පාඩුව පැවතුණි. මීට අමතරව අනියම් හා ආදේශක පදනමින් සභා අරමුදලින් වැටුප් ලබන සේවකයින් 09 දෙනෙකු සේවයේ යොදවා තිබුණි.

2.6 <u>සභාවට එරෙහිව හෝ සභාව විසින් ආරම්භ කර ඇති නෛතික කරුණු</u>

(අ). වැවගම මැද පාර මාර්ගය පුළුල් කිරීමේදී ඉඩම් හිමියන්ගේ විරෝධතා පැවතියදී ඒ ගැන නොසලකා එකී මාර්ගය පුළුල් කිරීම හේතුවෙන් අගතියට පත් පාර්ශවය විසින් තමාට සිදුව ඇති රු.100,000 ක අලාභය අයකර ගැනීම සඳහා ප්‍රාදේශීය සභාව පළමු විත්තිකරු කර 2010 නොවැම්බර් 30 දින නඩු පවරා තිබූ අතර, සභාව විසින් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නඩුවාර 15 ක් වෙනුවෙන් රු.21,500 ක නීතිඥ ගාස්තුවක් වැයකර තිබුණි.

(ආ) විධිමත් නඩු ලේඛණයක් විගණනයට ඉදිරිපත් නොවූ බැවින් සභාවට අදාල නඩු සම්බන්ධව තොරතුරු විගණනයට අනාවරණය නොවුණි.

2.7 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

(අ). පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එකී අරමුදලට ගෙවිය යුතු ශේෂය රු...1,452,460 ක් ව තිබුණි. එමෙන්ම සභාවට අදාල මාසක වාරිකය ලෙස රු...19,501 බැගින් එකී අරමුදල විසන් අයකර පැවතයද, එකී අයකිරීම් සභාවේ කුමන සේවකයන්ට අදාලවද යන්න සභාව දැනුවත් වී නොතිබුණි.

(ආ). සභාව විසින් සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාකාර සැලැස්මක්ද පිළියෙල කර සභා අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) වැය විෂයයන් 3 ක් යටතේ රු.69,961,000 ක ප්‍රතිපාදන ඉක්මවීම් සඳහා වැය මාරු හෝ පරිපූරක මගින් අතිරේක ප්‍රතිපාදන සලසාගෙන නොතිබුණි.

(ඈ) සභාව විසින් කි.මී. 31 ක් පමණ වූ මංමාවත් නඩත්තු කිරීම සඳහා රු.81,726,542 ක පිරිවැයක් දරා තිබූ අතර, සුසාන භූමි, කාණු පද්ධති හා ළමා උද්‍යාන වෙනුවෙන් වර්ෂය තුල දැරූ නඩත්තු පිරිවැය වර්ගීකරණයක් කර නොතිබුණි.

(ඉ) සභාව විසින් ඉටුකිරීමට අපේක්ෂා කර තිබූ රු.6,300,000 ක් වූ ප්‍රාග්ධන ව්‍යාපෘතීන් 19 ක් හා රු.1,678,000 ක් වූ සුභ සාධන ව්‍යාපෘතීන් 12 ක් සමාලෝචිත වර්ෂය තුලදී ඉටුකර නොතිබුණි.

2.8 <u>ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය</u>

සභා බල ප්‍රදේශයේ එකතුවන අපද්‍රව්‍ය වලින් කාබනික අපද්‍රව්‍ය කොම්පෝස්ට් නිපදවීම සඳහා කුලියාපිටිය නගර සභා ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානය වෙත භාරදීම සිදුව තිබූ අතර, අනෙකුත් අපද්‍රව්‍ය වර්ග කිරීමකින් තොරව පෞද්ගලික ඉඩම් 03 ක වළ ක්‍රමය යටතේ බැහැර කිරීම සිදුව තිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ). වත්කම් කළමනාකරණය

(ඉ) මානව සම්පත් කළමනාකරණය